# රූපවාහිනී මාධ්‍යයේ ප්‍රභේදන ව්‍යුහය; ඓතිහාසික පරිණාමය සහ එහි ප්‍රමිතිකරණයේ ගැටලු

**ආචාර්ය ටියුඩර් වීරසිංහ**

21 වන සියවසේ සංස්කෘතියෙහි රූපවාහිනිය යනු බහුතලීය සහ බහු අංශයීය ප්‍රපංචයකි. සමකාලීන සංස්කෘතිය කෙරෙහි වඩාත්ම බලපෑමක් කරන සංහතික මාධ්‍යයක් වශයෙන් රූපවාහිනී මාධ්‍යයේ කාර්යය සංහතික විඥාපන මාධ්‍යයේ සිට මිනිසුන් හට සෞන්දර්යාත්මකව ඉහළ බලපෑමක් කිරීමට සමත් උසස් කලා මාධ්‍යයක් දක්වා විහිදී යන්නේය. විසි වන සිය වසේ හතළිස් වන දශකයේ ආරම්භවන රූපවාහිනිය දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් අනතුරුව හැටේ දශකයේ දී ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු යුරෝපා රටවල ප්‍රචලිත වී, ඉන් පසුව ලෝකයේ සෙසු රටවලට ද පැතිර ගියේය. රූපවාහිනිය ඉතා කෙටි කාලයක් තුළ දී සංහතික විඥාපන මාධ්‍යයක් බවට ද සංහතික විනෝදායන මාධ්‍යයක් බවට ද පත්ව එය වර්තමාන වන විට ජාතික හා ගෝලීය සංහතික පාලනයේ මෙහෙයවීමේ ප්‍රබල දෘෂ්ටිවාදී මෙවලමක් බවට ද පත් වී තිබේ. සමකාලීන රූපවාහිනිය ඉටු කරනු ලබන මූලික කාර්ය පද්ධතියට අනුකූලව එහි අද්‍යතන නිර්මාණ ප්‍රභේදන (Genre) ව්‍යුහය ගොඩනැගී ඇතිබව ප්‍රකාශ කළ යුතුය.

Genre (ප්‍රභේදනය) යන සංකල්පය හෝ අවබෝධනය ප්‍රංශ භාෂාවෙන් වර්ගය, ප්‍රභේදය, ජාතිය යන අර්ථය ප්‍රකාශ කිරීම සඳහා භාවිත කරන අතර, මෙය වර්තමානය වන විට නිර්මාණකරණයේ සියලු ක්ෂේත්‍ර සඳහා ව්‍යවහාර කරනු ලැබේ. කලාත්මක සාහිත්‍ය තුළ නවකතා, කෙටිකතා, ගද්‍ය, පද්‍ය, ලෙස ද සංගීතය තුළ ගීතය, තූර්ය සංවාදය, ස්වර මාධූර්යය, උත්සවකාරී ගීතය, චිත්‍රකරණය තුළ, චිත්‍රය, පින්තූරය, සිතුවම, භූ දර්ශන චිත්‍ර, ආදිය නිදර්ශන වශයෙන් දැක්විය හැකිය.

ප්‍රභේදනයේ අවබෝධනය විවෘතකර ගැනීම සඳහා මෙම සියලුම ක්ෂේත්‍ර විවිධාකාර ප්‍රවේශ අනුගමනය කරනු ලැබේ. එසේම එම සියලුම ක්ෂේත්‍ර ඒකාබද්ධ කරන්නා වූ පොදු ලක්ෂණ ද තිබෙන බව අවධාරණය කළ යුතුය. ඕනෑම නිර්මාණාත්මක පඨිතයක සන්දර්භය ජීවිතයෙන් උත්පාදනය වේ. එම පඨිතය නිෂ්පාදකයින් එහි සන්දර්භය නිශ්චිත ස්වරූපයකට පරිවර්තනය කිරීමේ දී පෙර සංචිත අත්දැකීම් මෙන්ම විවිධක්‍රමවල භාවිතය ද සමග අදාළ ප්‍රභේදය නිර්මාණය වන්නේය.

කලාවේදය තුළ ද සාහිත්‍යවේදය තුළ ද සංහතික මාධ්‍යවේදය තුළ ද ප්‍රභේදනය එක් සංකීර්ණ සංකල්පයක් ලෙස ඉදිරිපත් වන බව පෙන්වාදිය යුතුය. එනම් සාහිත්‍යකලා හා මාධ්‍යක්ෂේත්‍රවල ප්‍රභේදනය පිළිබඳ සංකල්පය තවම නිශ්චිත විද්‍යාත්මක වූ පොදු පිළිගත් නිර්වචනයක් දක්නට නොමැත. ඒ අනුව එය පොදු කලාත්මක න්‍යාය තුළ ප්‍රභේදනය කලාත්මක ස්වරූපයක් ලෙස ද ඓතිහාසිකව හැඩගැසුණු නිර්මාණ වර්ගයක් ලෙස ද අදාළ ප්‍රභේදනයට පමණක් ආවේණික වූ ව්‍යුහ - සංරචනාත්මක සංඝටකයන්ගේ ඒකීයත්වයක් ලෙස ද සලකනු ලැබේ. ප්‍රභේදනය යනු කුමක්ද? සෑම නිර්වචනයක් ම නිෂ්ප්‍රභ කළ නොහැකි අතරම නමුත් ප්‍රභේදන යනු මොනවාද යන්න ඒකාර්ථමය නිර්වචනයක් හෝ පිළිතුරක් නැති බව නේවා දිය යුතුය.

ඇරිස්ටෝටල් (ක්‍රි.පූ. 384-322) සිය කාව්‍ය හා වාග්ලංකාරය නම් වූ කෘතියෙහි යථාර්ථය නිරූපණය කරන ආකාරය අනුව ප්‍රභේද නිර්ණය වන බව පෙන්වා දුන් අතර, එය පසු කාලීනව යථාර්ථවාදී සාහිත්‍යයේ සහ සමාජ-දේශපාලන විචාරයේ නියෝජිතයින් විසින් ඉදිරියට වර්ධනය කළේය. සාහිත්‍යය නිර්මාණ ප්‍රභේදනයේ දී පදනම වශයෙන් විෂයයික නිරූපණය ගත යුතුය යන අදහසේ ප්‍රධානියා ලෙස නූතනවාදී දර්ශනිකයා ලෙස ඉදිරිපත් වූයේ හේගල්ය. හේගේලියානු ආස්ථානයට බිලින්ස්කි සිය සහයෝගය පළ කළ අතර, ඔවුන්ගේ මූලික සංකල්පයට අනුව ගද්‍යය සඳහා නිර්මාණාත්මක සාධකය වන්නේ සංසිද්ධි වාචිකත්වය නිරූපණය ද කාව්‍යය සඳහා ආධ්‍යාත්මික තත්ත්වයේ නිරූපණය ද, නාට්‍ය සඳහා ක්‍රියාකාරීත්වය ද වන බවය. මේ අනුව ඇරිස්ටෝටලියානු සහ හේගේලියානු සාහිත්‍ය කලා ප්‍රභේදනකරණයේ ක්‍රමවේදී හා සන්දර්භය ප්‍රතිවිරෝධතා නොමැති බව පෙන්වාදිය යුතුය.

ප්‍රභේදනය යන පාරිභාෂිකය සංහතික මාධ්‍යකරණය තුළට පැමිණ ඇත්තේ සාහිත්‍යවේදය තුළිනි. ප්‍රභේදනය පිළිබඳව සාහිත්‍යවේදය තුළ වූ ගැටලුව සංහතික මාධ්‍යවේදය තුළට ද ගමන් කළ අතර, ආරම්භක අවධියේ දී සමාජ-දේශපාලන විචාරව (සමාජ-දේශපාලන ප්‍රකාශනාර්ථීලේඛනවේදය) සාහිත්‍යවේදයේ ප්‍රභේදනයක් ලෙස සලකන ලදී. ඇත්ත වශයෙන්ම ආරම්භයේ දී සාහිත්‍ය සහ විචාරය වෙන් කර හඳුනා ගැනීමට නොහැකි තරමටම ඒවා අන්‍යෝන්‍ය වශයෙන් සමීප විය. සත්‍ය වශයෙන් ම සමාජ-දේශපාලන විචාරීය ප්‍රභේදන සහ සාහිත්‍යයික ප්‍රභේදන අතර බොහෝ පොදු ලක්ෂණ පවතින බව අවධාරණය කළ යුතුය. එහෙත් සමාජ-දේශපාලන ප්‍රකාශනාර්ථීවේදය ප්‍රභේදන සුවිශේෂීය ගුණාත්මකතාවන්ගෙන් සමන්විත වන්නේය. කලාත්මක සාහිත්‍ය නිර්මාණවලට ජීවන යථාර්ථය විෂය වුවත් එය සියලුම සංරචක තේමාව, කථාවස්තුව, චරිත හා චරිතාතර සම්බන්ධතා ආදිය ලේඛක පරිකල්පනයේ සහ කලාත්මක මනස්සෘෂ්ටියේ ප්‍රතිඵලයකි. සමාජ-දේශපාලන ප්‍රකාශනාර්ථී ලේඛනවේදයට හා සංහතික මාධ්‍යවේදයට විෂය වන්නේ යථාවිධ සාධක, සිද්ධි වන අතර, එහි තේමාව

දෛනික යථාවිද, යථාර්ථවාදී ජීවිතය තුළින් ලබා ගන්නේය. බොහෝවිට සංහතික මාධ්‍යකරුවා විසින් සිදු කරන්නේ එම සිදුවීම්වලට යම් කිසි නිශ්චිත ස්වරූපයක් ආරෝපණය කිරීමය. එම දෘෂ්ටිකෝණයට අනුව සංහතික මාධ්‍යකරණය කලාත්මක සාහිත්‍යයට වඩා චිත්‍රකරණයට සමීප වන්නේය. ප්‍රභේදනයට වඩාත්ම බලපාන්නේ පඨිතයට විෂය වන විෂයයේ ගතිලක්ෂණ බව සමහරු තර්ක කරති. තවත් සමහරෙක් තර්ක කරන්නේ ඊට වඩාත්ම බලපාන්නේ කර්තෘ විෂයට දක්වන සම්බන්ධතාව හා කර්තෘගේ ශෛලීය බවය. මේ අනුව කර්තෘ යථාර්ථයට දක්වන සම්බන්ධතාව, විෂයයෙහි ගැඹුරට යෑමේ ප්‍රමාණය ආදිය මත ප්‍රභේද සාධනය තීරණය වන බව පෙන්වාදිය හැකිය.

මේ සියලු කාරණා සැලකිල්ලට ගෙන සංහතික මාධ්‍යවේදීය හා සමාජ දේශපාලන විචාරික ප්‍රභේදනය යනු දෛනික ජීවිතයට බලපාන සිද්ධි හා සාධක එකතු කරමින් එය නිර්මාණාත්මක භාවිතයක් ඔස්සේ, නිශ්චිත ක්‍රමවේද භාවිත කරමින් සමාජයෙහි විඥාපන, තොරතුරු සන්නිවේදන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සංහතික මාධ්‍ය නාළිකා මගින් සමාජගත කරන නිෂ්පාදනයකි. ඔනෑම යනු දැනටමත් සූදානම් කර ඇති දෙයක් නොවේ. එය නිර්මාණයට, පඨිතයට ආවේණික ගුණාංගවල සහ ගතිලක්ෂණවල පොදු කිරීමකි. එම පොදු කිරීමේ ක්‍රියාවලිය ඍජු ලෙසම අදාළ මාධ්‍යවේදියාගේ හෝ සමාජ දේශපාලන ප්‍රකාශනාර්ථිකවේදියාගේ (සමාජ දේශපාලන විචාරකයාගේ) නිර්මාණ ශීලීත්වය සමඟ සම්බන්ධ බව අවධාරණය කළ යුතුය. එහි දී සංහතික මාධ්‍යවේදියා හෝ නිර්මාණකරුවා හෝ සාධක ත්‍රිත්වයක් සැලකිල්ලට ගත යුතුය. නිරූපිත විෂයයේ ගතිලක්ෂණ, ග්‍රාහකයාගේ අභිරුචිය හා රසඥතාව සහ මාධ්‍යවේදියාගේ වෘත්තීයභාවය ඒ සාධක තුනයි.

පොදු සංහතික විඥාපන ක්‍රියාවලියෙහි පවතින ප්‍රධාන ප්‍රභේදන කුලක ත්‍රිත්වයක් පෙන්වාදිය හැකිය. තොරතුරු ප්‍රභේදනය, විශ්ලේෂණාත්මක ප්‍රභේදනය හා වාර්තාත්මක කලාත්මක ප්‍රභේදනය ඒ ත්‍රිත්වයට අයත් වේ.

වර්තමානයෙහි ක්‍රියාත්මක වෙන්නේ රූපවාහිනී පඨිත ප්‍රභේදනය, විඥාපන (තොරතුරු) සමාජ-දේශපාලන ප්‍රකාශනාර්ථිවේදී ප්‍රභේදනය, විශ්ලේෂණාත්මක සමාජ-දේශපාලන ප්‍රකාශනයේ දී ප්‍රභේදනය හා කලාත්මක සමාජ-දේශපාලන ප්‍රකාශනාර්ථවේදය ලෙස කණ්ඩායම් තුනකට විමසා බැලිය හැකිය.

රූපවාහිනී පඨිත ප්‍රභේදනය රූපවාහිනිය යන ශ්‍රව්‍ය-දෘශ්‍ය සංහතික මාධ්‍ය බිහිවීමට පෙර සිටම ඒවා බිහිවීමට අවශ්‍ය සමාජ, සංස්කෘතික කලාත්මක සහ සංහතික විඥාපන ගතික හා ප්‍රවණතා මගින් දැනටමත් මතුකර තිබුණ බව පෙන්වා දිය යුතුය. ප්‍රථම වරට රූපවාහිනිය යන පාරිභාෂික පදය රුසියානු යුද ඉංජිනේරුවකු විසින් 1900 දී විද්‍යුතය පිළිබඳ පැවැති, ජාත්‍යන්තර සම්මේලනයක දී ඉදිරිපත් කළේය. 1909 දී පමණ රූවාහිනිය (Television) පදය බටහිර යුරෝපීය රටවල භාවිත වන්නට විය.

සංවිධිත හර සම්ප්‍රේෂණ රූපවාහිනී වැඩසටහන් 1936 දී එංගලන්තයේ (ලන්ඩන් නුවර) විකාශය වන අතර, එය දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් අනතුරුව පුළුල් ව්‍යාප්තියන් සනිටුහන් කළේය. මේ කාලය වන විට රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහය හැඩගැසීමේ ආරම්භක තත්ත්වයෙහි පසු වූ බව ප්‍රකාශ කළ යුතුය. 1960 වනවිට රූපවාහිනියේ ක්‍රියාකාරිත්වය සමීප ස්වරූපයක් ලෙස සංජානනය කරගන්නට විය. එකල නාට්‍ය,

චිත්‍රපට ආදිය රූපවාහිනිය මගින් ඉදිරිපත් කරන්නට වූ අතරම ස්වකීය සෞන්දර්යාත්මක ශක්‍යතා ද ඒ සමගම ප්‍රකට කරමින් රූපවාහිනියේ සෞන්දර්යාත්මක අවකාශය හැඩ ගැසෙන්නට විය. ඒ අනුව ක්‍රමානුකූලව රූපවාහිනියේ ප්‍රභේදන ව්‍යූහයේ මාදිලිය නිර්මාණය වන්නට විය. එය එක් අතකින් සංශ්ලේෂීය ප්‍රවණතාවක් ඔස්සේ ද අනෙක් අතින් අභිසාරී ප්‍රවණතාවක් ඔස්සේ ද වර්ධනය විය. ඒ ඔස්සේ ය, සෙසු කලාත්මක හා සෞන්දර්යාත්මක ප්‍රභේදනවලින් අනන්‍ය වූ නව ප්‍රභේදන ව්‍යූහයක් නිර්මාණය වීමේ ව්‍යවහාරික සහ න්‍යායයික ක්‍රියාදාමය ඉදිරියට වර්ධනය වන්නට වූයේ. හැටේ දශකය අවසානයේ සහ හැත්තෑව දශකය ආරම්භයේ දී රූපවාහිනිය ප්‍රබල කලාත්මක සෞන්දර්යාත්මක මාධ්‍යයක සිට එහි තවත් බලපෑ ප්‍රවණතාවක් ප්‍රකට කළේය. ඒ අනුව සංහතික විඥාපන දෘෂ්ටිවාදී ප්‍රවණතාවක් ඔස්සේ වර්ධනය වෙමින් රූපවාහිනිය කලාත්මක-සෞන්දර්යාත්මක සහ සංහතික විඥාපන-දෘෂ්ටිවාදී ප්‍රපංචයක් වශයෙන් සමාජ- සංස්කෘතික අවකාශය තුළ සංකීර්ණ වූ ද, ප්‍රතිවිරෝධී වූ ද කාර්යභාරයක් ඉටු කරන්නට විය. සමකාලීන රූපවාහිනියේ ප්‍රභේදන ව්‍යූහය තුළ අප ඉහත පෙන්වා දුන් ප්‍රවණතාවල ගතික හා ගතිලක්ෂණ ප්‍රකට වන බව නිරීක්ෂණය කළ හැකිය. එනම් සෑම රූපවාහිනී ප්‍රභේදනයකම එක්වරම කලාත්මක සෞන්දර්යාත්මක ගතිලක්ෂණ ද, සංහතික විඥාපනික ගතිලක්ෂණ ද සංහතික සංස්කෘතික ගතිලක්ෂණ ද, සම්භාව්‍ය හා ජන සංස්කෘතික ගතිලක්ෂණ ද, ප්‍රදර්ශනය වන්නේය. මේ තත්ත්වය ලෝක රූපවාහිනී ප්‍රභේදන ව්‍යූහයේ පරිණාමය දෙස සැලකිල්ලෙන් බැලීමේ දී පෙනී යයි. සෑම විටම අලුත් රූපවාහිනී වැඩසටහන් බිහිවීම යම් කතිකාවකට හේතු වී තිබේ. එක් අතකින් නාට්‍ය හා රංගකලාවේ මෙන්ම සිනමාවේ ප්‍රකාශන මාධ්‍ය ශක්‍යතා රූපවාහිනියේ කලාත්මක හා සෞන්දර්යාත්මක පැතිකඩ සකස්වීම කෙරෙහි තීරණාත්මකව බලපෑවේය. අනෙක් අතින් සංහතික සන්නිවේදන හා විඥාපන මාධ්‍යයට ආවේණික ශක්‍යතා රූපවාහිනියේ තොරතුරු හා විනෝදනය දෛනික පැතිකඩ සකස්වීම කෙරෙහි ප්‍රබල බලපෑමක් සිදු කළේය.

සංස්කෘතියේ විවිධ වූ ප්‍රභේද, වර්ග, ගති ලක්ෂණ ආදී පාදකව බිහි වූ තත්ත්වය හැඳින්වීම සඳහා රූපවාහිනී ප්‍රේක්ෂාව" යන සංකල්පය ද භාවිත කරනු ලැබේ. එය තොරතුරු කේන්ද්‍රීය වැඩසටහන්වලින් ආරම්භව වඩාත් සංකීර්ණ රූපවාහිනී හරඹයේ වැඩසටහන්වලින් අවසන් වේ. වර්තමානයේ දී එම විවිධ පරාසයන් කරා පැතිරී යන රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදනය කිරීමේ පොදු සීමා හා එම වැඩසටහන් අභ්‍යන්තරයෙහි පොදු අනන්‍යතා සෙවීම සංකීර්ණ ක්‍රමවේදීය අනිශ්චියතා මතු කරන්නේය. මෙම තත්ත්වය රූපවාහිනී ප්‍රභේදන ව්‍යූහය තුළ පමණක් නොව, පොදුවේ රූපවාහිනීවේදීය න්‍යාය තුළ ද ක්‍රමවේදීය ප්‍රශ්න ඇති කරන බව අවධාරණය කළ යුතුය. රූපවාහිනියේ පරිණාමයේ විවිධ යුගවල දී එහි මනෝවිද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක, සමාජ සංස්කෘතික වේදාත්මක, කලාත්මක, සෞන්දර්යාත්මක, සංහතික, විඥාපනවේදාත්මක පැතිකඩ පිළිබඳ අධ්‍යයන කර ඇති බව පෙනේ.

රූපවාහිනියේ ප්‍රභේදන ව්‍යූහයේ විකාශන විසි වන සිය වස අවසාන වන විට කොතෙක් දුරට සංකීර්ණ හා ප්‍රතිවිරෝධී තත්ත්වයක් අත්පත් කර ගත්තේ ද යත් එය එක් මාධ්‍යයක් ලෙස හැඳින්වීමෙන් වැළකී සිටියේය. එනම් රූපවාහිනිය කලා මාධ්‍යයක් පමණක් හෝ සංහතික තොරතුරු (විඥාපන) මාධ්‍යයක් පමණක් හෝ සංහතික

සන්නිවේදන මාධ්‍යයක් පමණක් හෝ ශ්‍රව්‍ය-දෘශ්‍ය සංස්කෘතියේ කොටසක් පමණක් ලෙස හෝ සංජානනය කර නොගැනීමයි. ඒ අනුව අද්‍යතන රූපවාහිනිය සමස්ත සංස්කෘතියේම සංස්ලේෂීය හා අභිසාරී මාධ්‍යයක් ලෙස සැලකීම යුක්ති සහගත බව අපගේ හැඟීමයි. එනම් රූපවාහිනිය සමකාලීන මානව සංස්කෘතිය තුළ "සංකීර්ණ බහුකෘත්‍ය පද්ධතියක්" ලෙස ක්‍රියා කරන්නේය.

මුලින්ම ලෝක රූපවාහිනියේ න්‍යාය සහ එහි ප්‍රභේදන ව්‍යුහයේ සංකල්පීය අධ්‍යයනයන් 20 වන සිය වසේ හැට හැත්තෑව දශකවල එංගලන්තයේ, ප්‍රංශයේ, ජර්මනියේ ඇමෙරිකා එක්සත් ජනපදයේ ජපානයේ ආදී රටවල පුළුල් අධ්‍යයනයන් හා ගවේෂණයන් ආරම්භ වන්නේය. එහෙත් විශේෂත්වය වන්නේ මෙම අධ්‍යයන ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ අවධානය යොමු වූයේ එහි තාක්ෂණික, සංහතික-විඥාපන පැතිකඩ කෙරෙහිය. රූපවාහිනිය කලාත්මක - සෞන්දර්යාත්මක ප්‍රකාශන මාධ්‍යයක් ලෙස අධ්‍යයනය නොකළේය.

මීට අමතරව මධ්‍යම හා නැගෙනහිර යුරෝපීය රටවල රූපවාහිනී පර්යේෂකයින්ගේ ද මූලික අවධානය යොමු වූයේ රූපවාහිනියේ ප්‍රභේදන ව්‍යුහයේ කලාත්මක හා සෞන්දර්යාත්මක පැතිකඩට වඩා එහි ඓතිහාසික පැතිකඩ කෙරෙහි බව සඳහන් කළ යුතුය.

කෙසේ වෙතත් මානව මානසිකත්ව ක්ෂේත්‍රය තුළ විවිධ මාධ්‍ය ප්‍රභේදන අධ්‍යයනය කිරීම සහ ඒවා නියමිත ක්‍රමවේදයකට අනුව වර්ගීකරණය කිරීම සංකීර්ණ කාර්යයක් බව අවධාරණය කළ යුතුය. ප්‍රභේදන ලෝකය තුළ පොදුවේ එම සංකීර්ණතාව හා දුෂ්කරතාව පවතී. විශේෂයෙන්ම සංහතික රූපවාහිනී මාධ්‍ය ක්ෂේත්‍රය තුළ එම සංකීර්ණතාව තවත් ප්‍රබල වන්නේ රූපවාහිනී මාධ්‍යයේ ස්වභාවය අනුව එය සංකීර්ණ සංශ්ලේෂී හා අභිසාරී මාධ්‍යයක් බව නිසාත්, එය සමාජ දේශපාලන, ආර්ථික සංස්කෘතික මෙන්ම දෛනික සමාජ ජීවිතයේ ප්‍රවණතා හා ගතික සමග අවියෝජනීය සම්බන්ධතාවක පවතින නිසාත්ය. සමකාලීන රූපවාහිනී තාක්ෂණික මෙන්ම ව්‍යාපාරික අභිසාරිතාව සමඟ පුළුල් අන්තර්ක්‍රියාකාරිත්වයක පසුවන බව සඳහන් කළ යුතුය. අවසන් වශයෙන් සංහතික මාධ්‍ය ඇතුළ රූපවාහිනී මාධ්‍ය ක්ෂේත්‍රයෙහි ප්‍රභේදකරන ප්‍රබල ප්‍රධාන කොන්දේසි දෙකක් මත නිර්ණය වන බව පෙන්වාදිය හැකිය. එක් අතකින් සමාජ ආර්ථික සැකස්මේ ස්වභාවය හා එහි ගතිලක්ෂණ මගින් ද අනෙක් අතින් සංස්කෘතික - විඥාපන ක්ෂේත්‍රයේ වර්ධනයේ අභ්‍යන්තර නියාමයන් මගින් ද වශයෙනි. වර්තමාන ශ්‍රී ලාංකේය ඇතුළු ලිබරල් වෙළෙඳ පොළ අවකාශයක් තුළ ක්‍රියාත්මක වන රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහය - සමාජ - ආර්ථික සැකැස්මේ කොන්දේසිවලට සංවේදීව ක්‍රියා කරන බව පෙන්වා දිය යුතුය. මේ අනුව පොදුවේ සලකා බැලීමේ දී යථාර්ථය කලාත්මකව හා සෞන්දර්යාත්මකව පරාවර්තනය කිරීමේ අලුත් ස්වරූප, නිශ්චිත ඓතිහාසික තත්ත්වයන් මත රඳා පවතින බවත්, එසේම ඒ වන විට ශිල්පීය ක්‍රමවල හා තාක්ෂණයේ වර්ධනයේ නිශ්චිත මට්ටම් මත තත්ත්වාරෝපණය වන බවත් ප්‍රකාශ කළ යුතු වන්නේය.

රූපවාහිනිය යනු විසි වන සිය වසේ සංහතික මාධ්‍යවේදයේ, විද්‍යාවේ, කලාවේ විද්‍යා-තාක්ෂණික චින්තනයේ හා ආර්ථික සියලු ජයග්‍රහණ ඒකාබද්ධකරගන්නා වූ වඩාත් බලපෑම් සහිත මාධ්‍යයකි. සමාජ විඥාපනයේ හා සන්නිවේදනයේ අලුත් ප්‍රභවයන් හා

ප්‍රභේද බිහිවීම අදාළ පද්ධතිය තුළ ප්‍රමුඛතා ප්‍රතිව්‍යුහකරණයට තුඩු දෙන්නේය. ඒ අනුව සංහතික තොරතුරු (විඥාපන) ක්ෂේත්‍රයේ අලුත් මාධ්‍යක් ලෙස ප්‍රවෘත්පත්, ගුවන්විදුලිය, රූපවාහිනිය බිහි වීම සාම්ප්‍රදායික හා නූතන මුද්‍රණ හා විද්‍යුත් මෙන්ම පෙර වූ ජනමාධ්‍ය (Falk Media) හා සංහතික මාධ්‍ය (Mass Media) නූතන මාධ්‍ය හා නව මාධ්‍ය ආදිය ඊට නිදර්ශන ලෙස දැක්විය හැකිය. ශ්‍රී ලංකාවේ රූවාහිනියේ බිහිවීමේ සිටම එය ශ්‍රී ලංකා සමාජයෙහි ආධිපත්‍යය දැරූ සාම්ප්‍රදායික දෘෂ්ටිවාදයට එරෙහිව නව ලිබරල්වාදී දෘෂ්ටිවාදී ප්‍රවණතාවක් ඔස්සේ ක්‍රියාත්මක විය. එම ශ්‍රී ලාංකේය රූපවාහිනියේ පොදු දෘෂ්ටිවාදී ප්‍රවණතාව නව ලිබරල්වාදී යටත්විජිත ප්‍රජාතන්ත්‍රවාදී සමාජ - මානසික පරිසරයකින් නිර්මාණය කිරීමෙහි ලා සුවිශාල බලපෑමක් සිදු කළ බව සඳහන් කළ යුතුය. වර්තමාන ශ්‍රී ලාංකේය සමාජය එහි ඓතිහාසික පරිණාමයේ පශ්චාත් යටත්විජිතවාදී ප්‍රජාතාන්ත්‍රික අවධියට ප්‍රවිෂ්ටව ඇති අතර, ඊට සරිලන ආකාරයට රූපවාහිනියේ ප්‍රභේදන දෘෂ්ටිවාදය ද හැඩ ගැසී ඇති බව පෙන්වාදිය යුතුය.

ඕනෑම අන්තර්ගතයක්, සන්ධාරයක් යම් කිසි ස්වරූපයක් හෝ සන්දර්භීය සම්බන්ධතාවක් තුළ සකස්වේ. එසේම එම අවබෝධන, සංකල්ප දෙක අපෝහකාත්මක ප්‍රභේදනීය ඒකීයත්වයක් තුළ පවතී. ස්වරූපය හෝ සන්දර්භීය සම්බන්ධතා යනු අභ්‍යන්තර සම්බන්ධතාවල, සංරචකයන්ගේ හා ක්‍රියාවන්ගේ සංවිධානාකාරයේ ප්‍රකාශ වීමකි. මෙම සංකල්පීය පදනම මත අපට සංහතික මාධ්‍ය වේදාත්මක මෙන්ම විශේෂයෙන් රූපවාහිනී ප්‍රභේදන පිළිබඳව විමසා බැලිය හැකිය.

ප්‍රභේදන යනු යථාර්ථයේ නිරූපණයේ ඓතිහාසික වශයෙන් නිර්මිත වන්නා වූ ප්‍රභේදයකි. ප්‍රභේදනයට සාපේක්ෂ වශයෙන් තිරසාර ගතිලක්ෂණ හා ගුණාංග සමූහයක් අයත් වේ. මේ ප්‍රභේදනයේ අවබෝධන දීර්ඝකාලයක් තිස්සේ විවිධ සාධක සහ කොන්දේසිවල බලපෑම යටතේ සකස් වී ඇත. ඓතිහාසික ක්‍රියාවලිය තුළ විවිධ අලුත් ප්‍රපංචයක් බිහි වී මූලික වශයෙන් වෙනස් වූ සන්ධාරයක්, අන්තර්ගතයක් තුළ තව දුරටත් පෙර වූ ස්වරූපය හෝ සන්දර්භීය සම්බන්ධතා ආරක්ෂා කර ගෙන තිබෙන අවස්ථා ද බොහෝමයක් නිරීක්ෂණය වන්නේය.

සංහතික මාධ්‍යවේදීය ප්‍රභේදන යනු සංහතික විඥාපන අන්තර්ගතය හෝ සන්ධාරය සාපේක්ෂ වශයෙන් ස්ථිරසාර ව්‍යුහ සන්දර්භීය සැකැස්මක් තුළ සංවිධානය වීමකි. එය යථාර්ථය නිරූපණය කිරීමේ අපූර්වත්වය, විශේෂත්වය සහ සංහතික මාධ්‍යවේදියා ඊට දක්වන සම්බන්ධතාවේ ගතිලක්ෂණවලට අනුව තක්සේරුාරෝපණය වන බව ප්‍රකාශ කළ යුතුය.

රූපවාහිනිය ප්‍රාග්රූපවාහිනිය සංහතික මාධ්‍යකාර්යයන්, ස්වරූප හා ක්‍රමවල ආභාසය ලබමින් සිය අනන්‍යතාව මෙන්ම එහි ප්‍රභේදනවල අනන්‍යතාව ද ගොඩනගාගෙන ඇති බව පෙනේ. මේ අනුව ප්‍රභේදනය සාහිත්‍ය, කලාත්මක, සෞන්දර්යාත්මක පදාර්ථයක් පමණක් නොවේ. එය මූලික වශයෙන් සමාජ-ඓතිහාසික පදාර්ථයකි. නිදර්ශන වශයෙන් ජන සමාජය (Folk Society) නම් වූ ඓතිහාසික සන්ධාරය තුළ එහි මාධ්‍ය ප්‍රභේදනය වශයෙන් ජන මාධ්‍ය (Folk media) ක්‍රියාත්මක වූ අතර, එහි උප ජනමාධ්‍ය ප්‍රභේදන වශයෙන් ජන ගී, ජන නාට්‍ය, ජන නැටුම්, ජන කලාව ආදිය ක්‍රියාත්මක විය. එය මානව වර්ගයාගේ සමාජ පරිණාමයේ පුරාතන හා මධ්‍යතන යුගවලට මූලික වශයෙන් අයත්විය. එනම් සාම්ප්‍රදායික සමාජය හා සම්බන්ධ විය. සංහතික සමාජය (Mass Society)

නම් වූ ඓතිහාසික සන්ධාරය තුළ එහි මාධ්‍ය ප්‍රභේදනය වශයෙන් සංහතික මාධ්‍ය (Mass media) ද, එහි උප සංහතික මාධ්‍ය ප්‍රභේදන වශයෙන් පුවත්පත්, ගුවන්විදුලිය, රූපවාහිනිය, සංහතික කලාව ආදිය ද ක්‍රියාත්මක වේ. මෙය මානව වර්ගයාගේ සමාජ පරිණාමයේ නූතන හා පශ්චාත් නූතන යුගවලට මූලික වශයෙන් අයත් වන්නේය. එහෙත් ශ්‍රී ලංකාවේ තවමත් පුරාතන හා මධ්‍යකාලීන ඓතිහාසික සන්ධාර දරන ලද ස්වරූප නූතන සහ පශ්චාත් නූතන සන්ධාර හැඳින්වීම සඳහා භාවිත කරනු පෙනේ. නිදර්ශනයක් ලෙස නූතන යුගයේ සංහතික ප්‍රපංච "ජන" වශයෙන් හැඳින්වීම දැක්විය හැකිය.

රූපවාහිනී මධ්‍ය තුළ වන සියලු නිර්මාණවල, පඨිතවල විවිධත්වය ඔස්සේ වර්ගීකරණය කළ හැකිය. මේ අනුව සමකාලීන රූපවාහිනී මාධ්‍යයේ ප්‍රභේදන නිශ්චිත ප්‍රමාණයක් බෙදා දැක්වීම රූපවාහිනී මාධ්‍යවේදය පිළිබඳ න්‍යායයික අවබෝධයක් ලබා ගැනීමට පමණක් නොව, එය රූපවාහිනී මාධ්‍යවේදීන්ගේ ප්‍රායෝගික, ව්‍යවහාරික කටයුතු සඳහා ඉතා ප්‍රයෝජනවත් වන බව අපගේ අදහසයි. ඒ පමණක් නොව, අද්‍යතන ශ්‍රී ලාංකේය රූපවාහිනියේ ප්‍රභේදන අවබෝධනයේ දරිද්‍රතාවක් ප්‍රකට වේ. විශේෂයෙන් ඒ ඒ රූපවාහිනී ප්‍රභේදනවල අනන්‍යතා වූ ප්‍රමිතිය පිළිබඳ ගැටලු දැඩි ලෙසම පවතින බව පෙනේ. එක් රූපවාහිනී ප්‍රභේදයකින් තවත් රූපවාහිනී ප්‍රභේදයක් වෙන්කර හඳුනාගැනීම සාමාන්‍ය රූපවාහිනී ප්‍රේක්ෂකයින්ට පමණක් නොව, රූපවාහිනී මාධ්‍ය වෘත්තිය ක්ෂේත්‍රයෙහි නියැලී රූපවාහිනී මාධ්‍යකරුවන්ට පවා දුෂ්කර වී ඇත. වාර්ෂිකව පැවැත්වෙන රාජ්‍ය ටෙලි සම්මාන උළෙලට නිර්මාණ යොමු කිරීමේ දී ඒ අදාළ නිශ්චිත වර්ගීකරණවලට අනුව රූපවාහිනී නිර්මාණය යොමු කිරීමට බොහෝ දෙනෙකු අසමත් බව පෙනේ. මේ නිසා සමකාලීන ශ්‍රී ලාංකේය රූපවාහිනියේ ප්‍රභේදන ව්‍යුහය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ඇති කිරීමත්, ප්‍රභේදන ව්‍යුහ රූපවාහිනී තොරතුරු ප්‍රතිපත්තිය සමග දක්වන සම්බන්ධතාව තේරුම් ගැනීමත්, එසේම රූපවාහිනී ප්‍රභේදන විවිධත්වය තුළ එක් එක් රූපවාහිනී ප්‍රභේදනයේ අනන්‍යතා සහ සීමා මෙන්ම ප්‍රතිමාන ගතිලක්ෂණ හඳුනාගැනීමත් උසස් රූපවාහිනී ප්‍රභේදන සංස්කෘතියක් ඇති කිරීම සඳහා ඉතා වැදගත්වන බව පෙන්වා දිය යුතුය.

මීට පෙරදී සඳහන් කළ පරිදි සාමාන්‍යයෙන් සමකාලීන සංහතික මාධ්‍ය සංස්කෘතිය තොරතුරු (විඥාපන), විශ්ලේෂණාත්මක සහ සමාජ දේශපාලන ප්‍රකාශනාර්ථවේදීය ලෙස මූලික ප්‍රභේදන තුනට බෙදයි. ඉන් අනතුරුව එම ප්‍රධාන ප්‍රභේදන ත්‍රිත්වය තවත් උප ප්‍රභේදන රාශියකට බෙදාවෙන් කර ඇත.

අද්‍යතන රූපවාහනී ප්‍රභේදන පද්ධතිය මූලික මට්ටම් කීපයක් ඔස්සේ හඳුනා ගැනේ. ඒ අතර, ප්‍රධාන ඒවා දෙකකි. ඉන් පළමු වැන්න විඥාපන (තොරතුරු) දේශපාලන සමාජ ප්‍රකාශනාර්ථවේදී ප්‍රභේදනය වේ. ඊට විඥාපන (තොරතුරු) සම්ප්‍රවේශනය විවරණය සමාලෝචනය, වාර්තාකරණය, සම්මුඛ සාකච්ඡා, සාකච්ඡා, කතිකා මාධ්‍ය හමුව, අයත් වන බව පෙන්වාදිය යුතුය. දෙවැන්න වන්නේ කලාත්මක ප්‍රභේදනයයි. ඊට කෙටි පඨිත, වාර්තා චිත්‍රපටය, රූපදර්ශන චිත්‍රපට ඇතුළත් කළ හැකිය.

එහෙත් අද්‍යතන බටහිර හා ඇමෙරිකානු රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහය තවත් පුළුල් වීමක් දකිමු. එය බටහිර හා ඇමෙරිකානු සමාජයේ වර්ධනයේ නිශ්චිත මට්ටම් සමග සෘජු ලෙසම සම්බන්ධය. එම සමාජවල විවිධ තල විවිධ ක්ෂේත්‍රවල උද්ගතව

රූපවාහිනී මාධ්‍යයේ ප්‍රභේදන ව්‍යුහය.

ඇති තත්ත්වයන් හා ගැටලු පාදක කොට ගෙන එම රූපවාහිනී ප්‍රභේදකරණයේ ව්‍යුහය ප්‍රසාරණය වී ඇත. වෙනත් වචනවලින් ප්‍රකාශ කරනවා නම් යුරෝපා හා ඇමෙරිකානු රූපවාහිනී ප්‍රභේදන සාහිත්‍ය කලා සෞන්දර්ය ක්ෂේත්‍රයේ නියමයන්ට වඩා සමාජ, ආර්ථික දේශපාලන දෘෂ්ටිවාදී ගතික හා ප්‍රවණතා පාදකව වර්ධනය වන බව පෙනේ. සමස්තයක් ලෙස සලකා බැලීමේ දී ඇමෙරිකානු හා යුරෝපීය රූපවාහිනියේ ප්‍රභේදන ව්‍යුහය එම සමාජ වර්තමානයේ දී අත්පත් කරගෙන තිබෙන සමාජ හා පරිණාමයේ මට්ටමට සරිලන පරිදි සකස් වී තිබේ. සමකාලීන ඇමෙරිකානු හා යුරෝපීය සමාජය උපරි සමාජයක් දක්වා පරිණාමය වී ඇති අතර, එය පශ්චාත් ප්‍රජාතාන්ත්‍රික හා පශ්චාත් මානවවාදී අවධියකට ප්‍රවිෂ්ට වී ඇත. එම නිසා එම උපරිසමාජය තුළ කලාවේ, සෞන්දර්යයේ සංහතික විශ්‍ලේපනයේ සමාජ භූමිකාව වෙනස් වී ඇත. එය රූපවාහිනියේ ප්‍රභේදන ව්‍යුහයට සහ එහි ක්‍රියා කාරිත්වයට ද තීරණාත්මකව බලපා තිබේ.

සමකාලීන බටහිර රූපවාහිනීවේදය තුළ ප්‍රභේදකරණය සංකීර්ණ ස්වරූපයන් දක්වා වර්ධනය වී ඇති බව පෙන්වා දිය යුතුය. "රූපවාහිනී වෘත්තිකයින් සඳහා රූපවාහිනී ප්‍රභේදනය නිෂ්පාදන කර්මාන්තයේ සංවිධානයේ හා ව්‍යුහයේ කේන්ද්‍රය බවට පත්වී තිබේ." (Donaell 2007) අද්‍යතන ලෝක රූපවාහිනී නිර්මාණ කර්මාන්තය තුළ ක්‍රියාත්මක වන රූපවාහිනී ප්‍රභේදන හා රූපවාහිනී උප ප්‍රභේදන අතර ප්‍රවෘත්ති (News) ප්‍රමුඛ අංගයකි. එම ප්‍රවෘත්ති නම් ප්‍රධාන ප්‍රභේදනය යටතේ තවත් උප ප්‍රභේදන වශයෙන් ජාතික හා ලෝක ප්‍රවෘත්ති (National and World news), ප්‍රාදේශීය ප්‍රවෘත්ති (Local News), පිළිසඳර ප්‍රවෘත්ති (News talk) 24 පැය ප්‍රවෘත්ති (24 hour news) වේ. ඊට අමතරව ප්‍රවෘත්ති සඟරාමය ප්‍රභේදනය යටතේ විනෝදයන ප්‍රවෘත්ති පිළිසඳර (News talk-entertarnment), ගවේෂණාත්මක හෝ මහජන කටයුතු (Investigative or public affairs) උපප්‍රභේදනය සුප්‍රකට ප්‍රවෘත්ති (Celebrity news) දැක්විය හැකිය. තවත් රූපවාහිනී ප්‍රභේදනයක් වන පිළිසඳර වැඩසටහන් (talk shows) යටතේ උප ප්‍රභේදන වශයෙන් රාත්‍රි කාල පිළිසඳර වැඩසටහන් (Night time talk shows), දිවා කාල පිළිසඳර වැඩසටහන් (daytime talk shows), තොරතුරු සාකච්ඡා වැඩසටහන් (informational talk shows) ආදිය ඊට අයත් වේ.

තවත් ප්‍රධාන රූපවාහිනී ප්‍රභේදනයක් ලෙස ටෙලි නාට්‍ය (Teledrama) දැක්විය හැකිය. මේ යටතේ ද උප ප්‍රභේදන රාශියකි. වැඩ බිම පාදක නාට්‍ය, (Workplace drama) පවුල් නාට්‍ය (Family drama) මුහුන් නාට්‍ය (Hybrid drama) ටෙලි චිත්‍රපට (Telefilms) වාර්තා නාට්‍ය (Docudramas) මීට අමතරව බටහිර රූපවාහිනී ප්‍රභේදනය තුළ ගෘහස්ථ ඔපරාව (Soap Opera) ලෙස ප්‍රධාන රූපවාහිනී ප්‍රභේදනයක් ජනප්‍රිය අතර, එහි උපප්‍රභේදන ලෙස දිවාකාල නාට්‍ය (Daytime Drama) රාත්‍රිකාල නාට්‍ය (Night drama) ආදිය දක්නට ලැබේ. විද්‍යාප්‍රබන්ධ (Science fiction) වශයෙන් රූපවාහිනී ප්‍රභේදයක් ද තිබේ. වර්තමාන රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහය තුළ වඩාත් බහුලව භාවිතවන රූපවාහිනී ප්‍රධාන ප්‍රභේදනයක් ලෙස යථාකාර රූපවාහිනිය (Reality television) හැඳින්විය හැකිය. එසේම රූපවාහිනියේ ප්‍රධාන ප්‍රභේදන ලෙස ක්‍රීඩා, ළමා, රූපවාහිනිය, හරඹ (games) ආදී වැඩසටහන් වර්තමානයේ දී දක්නට ලැබේ.

මේ එක් එක් රූපවාහිනී ප්‍රභේදනවල මූලික ස්වරූපය හා එහි ගතිලක්ෂණ පිළිබඳ සවිස්තරව ඉදිරිපත් කිරීමට මෙහි ඉඩ කඩක් නොමැති නිසා ප්‍රමුඛ රූපවාහිනී ප්‍රභේදන කීපයක් පිළිබඳව කෙටි විස්තරයක් ගෙන හැර දැක්වීමට බලාපොරොත්තු වෙමු.

## තොරතුරුමය (ප්‍රවෘත්තිමය) ප්‍රභේදන

රූපවාහිනියෙහි වඩා වැඩි ප්‍රමාණයක් හා ස්ථානය ගන්නා රූපවාහිනී ප්‍රභේදනය වන්නේ තොරතුරු කේන්ද්‍රීය වැඩසටහන්ය. මෙම තොරතුරු මූලික වශයෙන් යම් සිද්ධියක් පිළිබඳ තොරතුරු වන අතර, ඒවා ක්ෂණිකභාවය, නම්‍යතාව, සම්පිණ්ඩිතභාවය, තීව්‍රතාව, සංක්ෂිප්තභවය හා සක්‍රියතාව යන ගුණාංගවලින් සමන්විත වන්නේය. තොරතුරු ප්‍රභේදන රූපවාහිනී වැඩසටහන් ඒවා ඉදිරිපත් කරන සම්ප්‍රවේශන ආකාරය අනුව සුවිශේෂත්වයක් දරන බව සඳහන් කළ යුතුය. එම තොරතුරු සැබෑ කාලය තුළ "විදුලි පණිවිඩ ශෛලියේ" ස්වරූපයක් ගන්නේය. මෙම තොරතුරු ප්‍රධාන වශයෙන් සමාජ-දේශපාලන ප්‍රවණතාවක් දරයි. මෙම තොරතුරු (ප්‍රවෘත්ති) ප්‍රභේදනයේ වඩාත්ම වැදගත් උප ප්‍රභේදනය වන්නේ ප්‍රවෘත්ති (news) වේ. එය අලුත් සිද්ධියක් පිළිබඳව වඩාත් ක්ෂණික වැදගත් හා ප්‍රයෝජනවත් යන ලක්ෂණවලින් සමන්විත වේ.

රූපවාහිනී ප්‍රවෘත්ති (තොරතුරු) ප්‍රභේදනයට අයත්වන තවත් උප ප්‍රභේදනයක් වන්නේ ලුහුඬු ප්‍රවෘත්තිය. එය යම් සාධකයක් පිළිබඳව සංක්ෂිප්ත සන්නිවේදනයක් වන මෙය පොදු සංහතික මාධ්‍යවේදාත්මක ප්‍රභේදනයකි. මෙය කාලානුක්‍රමික සන්නිවේදනය ලෙස ද හැඳින්වේ. එහි දී සිදුවන්නේ ඓතිහාසික සිදුවීම් කාලානුරූපික අනුක්‍රමිකතාව අනුව ගෙන හැර දැක්වීමය. රූපවාහිනිය තුළ ලුහුඬු ප්‍රවෘත්ති ප්‍රභේදනය වාච්‍ය මෙන්ම රූපදර්ශන ලුහුඬු ප්‍රවෘත්ති ආදී ස්වරූපයෙන් ඉදිරිපත් විය හැකිය. වාර්තා චිත්‍රපටවේදය තුළ රූපදර්ශන ලුහුඬු ප්‍රවෘත්ති ප්‍රභේදනය බොහෝ විට කාලානුක්‍රමික වාර්තාකරණය ලෙස හඳුන්වනු ලැබේ. එහි දී සිදු වන්නේ අදාළ සිද්ධිය සම්බන්ධව ප්‍රධාන සන්ධිස්ථාන හෝ අවස්ථා එහි ස්වාභාවික අනුක්‍රමිකතාව අනුව පෙන්වීමයි. ලුහුඬු ප්‍රවෘත්ති, තොරතුරු (විඥාපන) ප්‍රභේදනය තුළ වඩාත්ම ව්‍යාප්තව පවතින උප ප්‍රභේදනයක් ලෙස සැලකිය හැකිය. මෙම රූපවාහිනී ප්‍රභේදනය පැයෙන් පැය හෝ පැය භාගයෙන් භාගය හෝ ඉදිරිපත් වන ප්‍රවෘත්ති නිවේදන ඔස්සේ ඉදිරිපත් වන බව දැක ගත හැකිය. රූපවාහිනී ලුහුඬු ප්‍රවෘත්ති ඊට අදාළ රූප දර්ශනවලින් තොර ව ද විකාශ විය හැකිය. ඊට මූලික හේතුව වන්නේ සිද්ධියට අදාළ ප්‍රවෘත්තිය ක්ෂණිකව ඉදිරිපත් කළ යුතු බැවිනි. ක්ෂණිකභාවය සංහතික ප්‍රවෘත්තිකරණයේ අවශ්‍යයික හා ආවේණික ලක්ෂණයකි. මෙහි දී වඩාත් වැදගත් වන්නේ කවුද? මොනවාද? කොහේද? කවදාද? යන ප්‍රශ්න මිස කෙසේද? ඇයිද? යන ප්‍රශ්න නොවේ.

රූපවාහිනී ප්‍රවෘත්තිමය ප්‍රභේදනයට අයත් වන තවත් උප ප්‍රභේදනයක් ලෙස නිල වාර්තාමය ප්‍රවෘත්ති හැඳින්විය හැකිය. මෙය රාජ්‍ය හා නිල ක්‍රියාකාරකම් හා සම්බන්ධ වූ ද සමාජීය වශයෙන් වැදගත් වූ ද තොරතුරු විශේෂයක් සහිත සන්නිවේදයකි. සමහරවිට නිල වාර්තාමය ප්‍රවෘත්ති සංක්ෂිප්ත ස්වරූපයෙන් මාධ්‍යවේදියාගේ විවරණයක් සමඟ ද ඉදිරිපත් විය හැකිය. බොහෝ විට මේ වර්ගයේ රූපවාහිනී ප්‍රභේදනය විවරණයකින් තොර වාර්තාකරණයකට සමානය. රාජ්‍ය නායකයින්ගේ පැමිණීම ඇතුළු නිල රාජ්‍ය සිද්ධි සජීවිව විකාශනය කිරීම නිදර්ශන ලෙස දැක්විය හැකිය. සම්මුඛ සාකච්ඡා වනාහී රූපවාහිනී, සමාජ-දේශපාලන ප්‍රකාශ සාර්වේදීය ප්‍රභේදනයේ උප ප්‍රභේදනයකි. මෙහි දී මූලික ප්‍රකාශන මාධ්‍යයන් වශයෙන් වචන, සජීවී මානව කථනය පවතී. එහි ස්වරූපය ලෙස දෙබස් සහ සමාශ්‍රය ඉදිරිපත්වේ. මෙය රූපවාහිනිය සඳහා අති විශාල වැදගත්කම් දරන්නේ සන්නිවේදන ක්‍රියාවලිය මානව කථනය සමඟම හා ඊට සමගාමීව අභිරූපණය,

අංගචලනය ද පුළුල් ආකාරයට අදහස් ප්‍රකාශ කිරීම සඳහා යොදා ගැනීමයි. අන්තර් පුද්ගල සාමාශ්‍රයේ හා සන්නිවේදනයේ ලක්ෂණ වඩාත් සංකේන්ද්‍රියව හා පරිපූර්ණව ප්‍රකාශයට පත් වන්නේ සමුඛ සාකච්ඡා ප්‍රභේදයේදීය. විවිධ වර්ගයේ සම්මුඛ සාකච්ඡා ප්‍රවෘත්තිමය, පුද්ගල කේන්ද්‍රීය, ගැටලු කේන්ද්‍රීය, සිද්ධි වාචික සම්මුඛ සාකච්ඡා ආදි වශයෙන් තවත් රාශියක් තිබෙන බව සඳහන් කළ යුතුය.

රූපවාහිනියේ නියම ස්වභාවය නිරූපණය කරන තවත් ප්‍රභේදයක් වන්නේ රූපවාහිනී වාර්තාකරණයයි. අවස්ථායන සාදන හා තේමාත්මක ආදී වශයෙන් ප්‍රධාන වාර්තාකරණ ත්‍රිත්වයක් රූපවාහිනී මාධ්‍ය තුළ දැකිය හැකිය. එක් අතකින් සංහතික මාධ්‍යවේදයේ සමස්ත ඉතිහාසය යනු සැබෑ ජීවිතයට සමීප වන ආකාරයට වාර්තාකරණයේ ස්ථාපිතවීම හා පරිපූර්ණත්වයට පත්වීමකි. අනෙක් අතින් රූපවාහිනී වාර්තාකරණ ප්‍රභේදයක් වශයෙන් වර්ධනයවත්ම මිනිසා දෛනික සමාජ යථාර්ථයට දක්වන සම්බන්ධතා ද සැලකිය යුතු මට්ටමින් වෙනස් වන්නට විය.

සිද්ධිවාචික රූපවාහිනී වාර්තාකරණයේ දී වාර්තාකරුගේ ඍජු මැදිහත් වීමෙන් බෙහෝ දුරට ස්වාධීනව සිද්ධියේ සැබෑ තත්ත්වය පෙන්වාදීම සිදු කෙරේ. එහි මූලික අරමුණ වන්නේ සිද්ධිය පිළිබඳ උපරිම නිශ්චිතතාවකින් හා ප්‍රමාණවත් සවිස්තරතාවකින් ප්‍රේක්ෂකයා දැනුවත් කිරීමය. අවස්ථායන වාර්තාකරණයේ දී සිදුවන්නේ රූපවාහිනිය මාධ්‍යවේදියා සිය වැඩසටහනින් පෙන්වීමට අදහස් කරන විෂය හා එහි සිදුවන සිදුවීම් වෙන්කර ගැනීමෙනි. ඒ ඔහු විසින් තෝරා ගෙන ඇති තේමාවට සරිලන ආකාරයටය. අවසාන වශයෙන් අවස්ථායනසාදන රූපවාහිනී ප්‍රභේදනය විමසා බලමු. මෙම වාර්තාකරණයේ දී සිද්ධියේ, අවස්ථාවේ සංවිධායකයා වශයෙන් විවෘත ලෙස ඉදිරිපත් වන්නේ රූපවාහිනී ප්‍රවෘත්ති (තොරතුරුමය) ප්‍රභේදනය තුළ නිර්විවරණාත්මක වාර්තාකරණයකි. එහි සජීවී සම්ප්‍රේක්ෂණයක් ක්‍රියාත්මක වේ. විශේෂයෙන් සමාජ-දේශපාලනික වශයෙන් හෝ සංස්කෘතික වශයෙන් හෝ ඉතා වැදගත් සිද්ධි එසේම සංහතිකයින්ගේ ඇඩි උනන්දුවක් පෙන්වන සිද්ධි හා අවස්ථා වාර්තාකරණය මීට නිදර්ශන ලෙස දැක්විය හැකිය. විවරණාත්මක රූපවාහිනී වාර්තාකරණ ප්‍රභේදනයේ දී කැමරා ශිල්පියා, සංස්කරණ ශිල්පියා, වාර්කරුවා ඇතුළු අය සක්‍රීය කාර්යභාරයක් ඉටු කරති.

මෙම තොරතුරුමය (ප්‍රවෘත්තිමය) රූපවාහිනී ප්‍රභේදනයට වඩා වෙනස් රූපවාහිනී ප්‍රභේදනයක් වන්නේ විශ්ලේෂණාත්මක ප්‍රභේදනයයි. විශ්ලේෂණාත්මක ප්‍රභේදන අතර ඉතා වැදගත් උප ප්‍රභේදනයක් ලෙස විවරණය ඉදිරිපත් වේ. සමාජ - දේශපාලන සිද්ධිවල ක්‍රියාදාමවල තත්ත්වාකරණාව, කාලීනත්වය පිළිබඳ අදහස් විමර්ශනාත්මකව ගෙන හැර දක්වන වැඩසටහන් විශේෂයකි.

සැමටම කලින් රූපවාහිනී විවරණය යනු තිරය මත ඉදිරිපත් කිරීමකි, තිරය මත වන සම්ප්‍රවේශනයකි. එසේම තිරයෙන් පිට සිට රූපවාහිනී මාධ්‍ය විවරණකරු කරන විවරණ ද දැකිය හැකිය. එහි දී තිරය මත තෝරාගත් රූපදර්ශන පෙන්වනු ලබයි. මූලික වශයෙන් විවරණ අයත් වන්නේ විශ්ලේෂණාත්මක සමාජ-දේශපාලන ප්‍රකාශනාර්ථවේදීය ක්ෂේත්‍රයටය. විවරණකරු අදාළ සිද්ධිය හෝ ක්‍රියාදාමය සාකල්‍ය ප්‍රවේශයක් ඔස්සේ ගෙන හැර දක්වමින් එහි හේතු - ඵල සම්බන්ධතා අනාවරණය කරනු ලැබේ.ප්‍රභේදනයක් ලෙස විවරණයේ පදනම වන්නේ කාර්තෘගේ විවෘත විග්‍රහය හා තක්සේරුවයි.

සමාලෝචනය රූපවාහිනී විශ්ලේෂණාත්මක ප්‍රභේදනයේ තවත් උප ප්‍රභේදනයක් ලෙස සැලකිය හැකිය. මෙහි දී ප්‍රේක්ෂකයින්හට සමාජ-දේශපාලන ප්‍රපංචයක් එහි හේතුඵල සම්බන්ධතාව තුළ පෙන්වා දෙයි. ඒවායේ වැදගත්කම හා අනාගත වර්ධන ප්‍රවණතා ද පැහැදිලි කරයි. සමාලෝචනය ප්‍රබල ලෙසම සාධකාත්මක මෙන්ම පාරිසිද්ධිවාචක වන්නේය. මෙය විවරණයෙන් වෙනස් වන්නේ, පළල් ගවේෂණය හා තොරතුරු කාලානුක්‍රමික රාමුවකට සීමා වී පවතී.

සිංහල ව්‍යවහාරය තුළ Repoter හා Correspondent යන පාරිභාෂික පද දෙකටම බොහෝ විට භාවිත කරනු ලබන්නේ වාර්තාකරු යන පදයයි. එහෙත් මෙම පාරිභාෂික පද දෙක සංහතික මාධ්‍යවේදයෙහි එකිනෙකට වෙනස් ප්‍රභේදන ක්ෂේත්‍ර දෙකකට අයත්වන බව සඳහන් කළ යුතුය. වාර්තාකරු (Reporter) ප්‍රවෘත්ති (තොරතුරු) ප්‍රභේදන ක්ෂේත්‍රයට ද විමර්ශනාත්මක වාර්තාකරු (Correspondent) විශ්ලේෂණාත්මක ප්‍රභේදන ක්ෂේත්‍රයට ද අයත්වන බව අවධාරණය කළ යුතුය. විමර්ශනාත්මක වාර්තාකරු සන්නිවේදනය කරනු ලබන්නේ සාමාන්‍යකරණය වියුක්තකරණය, පොදුකරණය, විශ්ලේෂණය කරන ලද සාධක වන්නේය. එහෙත් මෙම ප්‍රභේදනය සකස් කරනු ලබන්නේ මේ හෝ ඒ තත්ත්වාකාර ගැටලුවකට අදාළ නිශ්චිත තොරතුරු පාදක කොට ගෙනය.

## කලාත්මක - සමාජ ප්‍රකාශනාර්ථීවේද ප්‍රභේදනය

සාමාජික සංහතික මාධ්‍ය ප්‍රභේදන ව්‍යුහය තුළ සුවිශේෂ ස්ථානයක් හිමි වන අතර, රූපවාහිනිය තුළ ද කලාත්මක - සමාජ ප්‍රකාශනාර්ථීවේද ප්‍රභේදයට ඉතා වැදගත් තැනක් හිමි වන්නේය. කලාත්මක -සමාජ ප්‍රකාශනාර්ථීවේද ප්‍රභේදයේ කේන්ද්‍රීය උප ප්‍රභේදනය වන්නේ සංක්ෂිප්ත රචනාව (Essay) රූපවාහිනී තොරතුරුමය (ප්‍රවෘත්තිමය) සමාජ දේශපාලන ප්‍රකාශනාර්ථීවේදී ප්‍රභේදනයේ කේන්ද්‍රීය වාර්තාකරණය වන්නාසේම රූපවාහිනී කලාත්මත-සමාජ ප්‍රකාශනාර්ථීවේදී ප්‍රභේදනයේ කේන්ද්‍රීය සංක්ෂිප්ත රචනාව බව පෙන්වා දිය යුතුය. විශේෂයෙන් සංක්ෂිප්ත රචනාවේ ප්‍රභේදනීය ලක්ෂණ සාහිත්‍ය න්‍යාය තුළ මැනවින් පැහැදිලි කර තිබේ. ජීවන යථාර්ථය සහ සමාජ ජීවිතයෙහි ප්‍රපංච සිද්ධි හා සාධක කලාත්මක ප්‍රකාශන මාධ්‍යයන් ඔස්සේ නිරූපණය කිරීම මෙම රූපවාහිනී ප්‍රභේදනයේ ප්‍රධාන අරමුණයි. මෙම ප්‍රභේදන ස්වරූපය ජීවිතය හා යථාර්ථය පිළිබඳව කලාත්මක හා සෞන්දර්යාත්මක ප්‍රවේශයක්, ආකල්පයක් වර්ධනය කරනු ලබයි.

රූපවාහිනී වාර්තාකරණයෙහි ප්‍රත්‍යක්ෂය, යථාවිධභාවය ප්‍රායෝගිකත්වය ද, රූපවාහිනී සමාලෝචනයෙහි ගැටලුකාරිත්වය හා විශ්ලේෂණාත්මක බව ද, ප්‍රදර්ශනය කරන්නේ නම්, සංක්ෂිප්ත රචනාව මේ සියලු ගුණාංගයන් ඒකාබද්ධ කරමින් ජීවිතය පිළිබඳ ගැඹුරු ආකල්පයකින් ඉදිරිපත් කරන්නේය. මෙහි දී සඳහන් කළ යුත්තේ රූපවාහිනී සංක්ෂිප්ත රචනයේ විෂය බවට පත් වන්නේ මානව ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලවලට වඩා එහි කටයුතුවල ක්‍රියාකාරිත්වයයි; ක්‍රියාකාරිත්වයේ කාරක ලෙස මිනිසාමය. එසේම මෙම රූපවාහිනී ප්‍රභේදනයෙහි මධ්‍යයෙහි කර්තෘ විසින් පෙන්වන හා පැහැදිලි කරන සිද්ධියක් තිබෙන අතර, එහි අරමුණු වන්නේ සිද්ධියේ පසුබිමේ සිට මිනිසුන්ගේ ගතිලක්ෂණ අනාවරණය කිරීමයි. රූපවාහිනී වාර්තාකරණ ප්‍රභේදනය සිද්ධියේ ඉතිහාසය නම් රූපවාහිනී සංක්ෂිප්ත රචනා ප්‍රභේදනය ගතිලක්ෂණවල ඉතිහාසයයි.

කලාත්මක සමාජ ප්‍රකාශනාර්ථවේදී ප්‍රභේදනයේ තවත් උප ප්‍රභේදනය ලෙස ප්‍රබන්ධය (Essay) ඉදිරිපත් වේ. මෙම ප්‍රභේදනය මූලික වශයෙන් දාර්ශනික, සෞන්දර්යාත්මක, සාහිත්‍ය - විචාරාත්මක සමාජ - දේශපාලන ප්‍රකාශනාර්ථවේදී ප්‍රවණතාව නියෝජනය කරන්නේය. මෙහි දී ප්‍රබලවන්නේ කර්තෘගේ පුද්ගලික ආස්ථානයයි. මෙය බොහෝ විට කථන භාෂා ශෛලියකින් නිර්මිතව තිබේ. දාර්ශනික - සාහිත්‍ය විචාරය තුළ මෙම ප්‍රබන්ධ ප්‍රභේදනයේ පුරෝගාමියා වන්නේ ප්‍රංශජාතික දාර්ශනිකයෙකු හා මානවවාදියෙකු වූ මිෂෙල් මොන්ටේන්ය. සංහතික මාධ්‍ය ක්ෂේත්‍රයට ප්‍රබන්ධ ප්‍රභේදනය ඇතුළු වන්නේ 18 වන සියවසේ දීය. ආරම්භයේ දී ප්‍රබන්ධ ප්‍රභේදනය කෘෂිකර්මාන්තය, කලාව, සාහිත්‍ය, දේශපාලනය ආදී සෑම ක්ෂේත්‍රයක් තුළම පාහේ ක්‍රියාත්මක වූ අතර, ඉන් අනතුරුව ප්‍රබන්ධය බොහෝ විට සාහිත්‍යයට හා කලාවට පමණක් සීමා විය. රූපවාහිනියේ බිහිවීමත් වර්ධනයත් සමගම ප්‍රබන්ධ ප්‍රභේදනයට නව තත්ත්වයක්, නව ස්වරූපයක් ලැබුණි. රූපවාහිනී සන්නිවේදනයට ආවේණික භාවමය හා පුද්ගලික ලක්ෂණ පාදක කොට ගෙන කලාත්මක - සෞන්දර්යාත්මක සමාජ - දේශපාලන ප්‍රකාශනාර්ථවේදී වර්ධනය සිදුවේ. විශේෂයෙන්ම ප්‍රබන්ධ ප්‍රභේදනයේ ව්‍යුහය විසින්ම රූපවාහිනී මාධ්‍යවේදියා සමග හෝ තර්කය සමග හෝ සමීප සෘජු සම්බන්ධතා උත්කර්ෂණය වේ.

උපහාසාත්මක ප්‍රභේදනය ද රූපවාහිනී කලාත්මක-සමාජ ප්‍රකාශනාර්ථවේදී ප්‍රභේදයේ උප ප්‍රභේදනයකි. සාමාන්‍ය යුරෝපීය රූපවාහිනියේ වැඩසටහන් ව්‍යුහය තුළ උපහාසාත්මක ප්‍රභේදනයට විශේෂ ස්ථානයක් හිමිවන්නේය. සමාජ යථාර්ථය නිරූපණය කිරීමේ මාධ්‍යක් විශේෂ ක්‍රමයක් වශයෙන් රූපවාහිනියේ උපහාසාත්මක ප්‍රභේදය වාස්තවික සමාජ වැදගත්කම් දරන්නේය. රූපවාහිනියේ වාර්තාමය ස්වභාවය උපහාසාත්මක නිර්මාණවල කාර්යක්ෂමතාව හා ඵලදායිතාව කීප ගුණයකින්ම වර්ධනය කරන බව පෙන්වාදිය යුතුය. එසේම රූපවාහිනී උපාහාසාත්මක ප්‍රභේදනය ඔස්සේ රූපවාහිනී නිර්මාණකරුවා විවේචයට ලක් කරන පුද්ගලයා පිළිබඳව මෙන්ම සිය ප්‍රේක්ෂකයින් පිළිබඳව සුවිශාල වගකීමක් පැවරෙන්නේය. ප්‍රමිතිගත හා ගුණාත්මක උපහාසාත්මක රූපවාහිනී ප්‍රභේදන අතිශයින් විරලය. පවතින වැඩසටහන් ද ගුණාත්මකභාවයෙන් හීන ඌන සංවර්ධිත භාවයක් ප්‍රදර්ශනය කරන්නේය. මෙහි දී පෙන්වාදිය යුතු කරුණක් වන්නේ උපහාසය, හාස්‍යයෙන් මූලික වශයෙන් වෙනස්වන බවය. මේ දෙක අතර බාහිරින් පෙනෙන පොදු භාවය වන්නේ සිනා උපදවන ගතිය වුවත් හාස්‍යය බොහෝ විට කාරුණික සුහද, සෞම්‍ය, මෘදු ගතියක් ප්‍රකට කරයි. රූපවාහිනී හාස්‍යෝත්පාදක ප්‍රභේදනයන්හි චරිත ප්‍රේක්ෂකයා තුළ සහානුභූතික හැඟීමක් ජනිත කරන්නේය. උපහාසය යනු දෝෂ, වැරැදි අඩුපාඩු හෙළිදරව් කිරීම වන අතර, උපහාසය "විනාශකාරී සිනාවක්", "ප්‍රබලත්වයේ සිනාවක්" උපදවන්නේය. නිලධාරිවාදය, දූෂණය, අල්ලස, අසාධාරණය වැනි සමාජ ප්‍රපංචයන් රූපවාහිනී උපහාසාත්මක වැඩසටහන් සඳහා වස්තු බීජ බවට පත් වන්නේය.

මේ අප ඉහත ගෙන හැර දක්වන ලද රූපවාහිනී ප්‍රභේදන සහ ප්‍රභේදන ව්‍යුහය ස්ථිර, වෙනස් නොවන දෙයක් නොවේ. ඒවා ඉතාම ගතික, ලිහිල්, මිශ්‍රණ, අතුරුදහන් වන ලක්ෂණවලින් සමන්විතය. එනම් රූපවාහිනී එක් එක් ප්‍රභේදන මෙන්ම සමස්ත ප්‍රභේදන පද්ධතියම සාපේක්ෂ වශයෙන් ස්ථිර, ගතික ස්ථායිතාවක් ප්‍රකට කරන මානව

රූපවාහිනී මාධ්‍යයේ ප්‍රභේදන ව්‍යුහය.

නිර්මාණකරණයේ මාදිලියකි. එසේම රූපවාහිනී ප්‍රභේදන විවිධත්වය අතිවිශාල වන අතර, ඒවා අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය ද, අන්‍යෝන්‍ය සමතුලනය ද ප්‍රබල ආකාරයට ප්‍රකට කරන සංකීර්ණ සමාජ-සංස්කෘතික ප්‍රකාශන පද්ධතියකි.

සැමදාකම රූපවාහිනී ප්‍රභේදනය හා රූපවාහිනී ප්‍රභේදන පද්ධතිය කෙරෙහි රූපවාහිනිය ක්‍රියාත්මක වන සමාජ සැකැස්මේ ගතිලක්ෂණ සහ අදාළ සමාජයේ මානව හා සංස්කෘතික ද්‍රව්‍යයේ ස්වභාවය බලපා ඇති බව පෙන්වාදිය යුතුය

අද්‍යතනයේ රූපවාහිනිය ඇතුළුව සමාජ විඥානය සහ සංස්කෘතිය සමස්තයක් වශයෙන් සිය පැවැත්මේ හා වර්ධනයේ පශ්චාත් ප්‍රජාතන්ත්‍රවාදී හා පශ්චාත් නූතනවාදී හා උපරි බටහිරවාදී තලයකට, අවධියකට අවතීර්ණ වී තිබේ.

ඒ ඒ රටවල රූපවාහිනී ප්‍රභේදනකරණයේ ගුණාත්මක තත්ත්වය කෙරෙහි ඒ ඒ රටවල රූපවාහිනී මාධ්‍ය බිහිවීවේ දී, වර්ධනය වීමේ දී හා ස්ථාපිතවීමේ දී ඓතිහාසික තත්ත්වයන් බලපා ඇත. එයට, රූපවාහිනී මාධ්‍ය සංස්කෘතිය මෙන්ම සංහතික මාධ්‍ය ඇතුළු රූපවාහිනී මාධ්‍ය පිළිබඳ සංකල්පීය අවබෝධය බලපාන බව අවධාරණය කළ යුතුය.

සමකාලීන ගෝලීය මානව වර්ගයාගේ ලෝකාවබෝධය ලෝකසංජානනය හා ලෝකාසංවේදනය උස්මූලමය ලෙස විපරිවර්තනයට ලක් වී ඇත. එය ලෝකයට දක්වන සම්බන්ධතා පමණක් නොව, මිනිසා අනෙකාට දක්වන සංවේදිතාව ද තමා තමාටම දක්වන සම්බන්ධතාව ද අතිසරලීකරණයට, සැහැල්ලුවට හා ලිස්සා යන තත්ත්වයට ද පත් වී තිබේ. නූතනත්වයේ ප්‍රතිවිරෝධී ගතිකවලට හා ප්‍රවණතාවලට දක්වන ලද ප්‍රතිචාරයක් ලෙස පශ්චාත් නූතනවාදී අදහස් හා මානසිකත්වයක් සමාජය තුළ නිර්මාණය වී ඇත. යථාර්ථය කෙරෙහි මිනිසා දක්වන සම්බන්ධතාව බරපතළ නොවන අවිඥානික හා වගකීම් විරහිත තත්ත්වයකට පත් වී තිබේ. අද්‍යතන රූවාහිනියේ ප්‍රභේදන ව්‍යුහයේ වර්ධනය මෙන්ම සමාකාලීන සංස්කෘතියේ හා කලාවේ වර්ධනය ද පශ්චාත් නූතනවාදී දෘෂ්ටිවාදයේ බලපෑම හා ප්‍රමුඛතාව යටතේ සිදුවන බව පෙනේ. වැදගත් හා අර්ථවත් සියල්ල අතීතයේ දී බිහිවූවාය යන හැඟීමක් අද්‍යතනයේ දී සිදු වන්නේ ඒවා පිටපත් කිරීම හෝ කොපි කිරීම යන හැඟීමත් සමස්ත මානව සමාජ මානසිකත්වය තුළ ප්‍රබල වී ඇත. මේ නිසා අද්‍යතන රූපවාහිනී ප්‍රභේදන හෝ වැඩසටහන් සම්බන්ධව බරපතළ, නවෝත්පාදන හා නිර්මාණාත්මක ආකාරයක සම්බන්ධතාවක් තිබිය නොහැකිය. ඒ අනුව සියලු අර්ථවත් හා වැදගත් දේවල් සම්බන්ධව සංහතිකයින් තුළ උත්ප්‍රාසාත්මක ආකල්පයක් ගොඩනැගී ඇත. මෙම තත්ත්වය කොතෙක් දුර දිග ගොස් ද යත්, මරණය පිළිබඳව පවා උත්ප්‍රාසාත්මකව බැලීමේ ප්‍රවණතාවක් හැඩගැසී තිබේ.

මේ අනුව අපට පෙනී යන්නේ රූපවාහිනී ප්‍රභේදන බොහෝ සාධකවල හා කොන්දේසිවල බලපෑම යටතේ විපරිවර්තනයට භාජනය වන බවයි. තාක්ෂණික සහ සමාජීය සාධක මෙහි දී ඉතා වැදගත් වේ. සංහතික මාධ්‍යයේ හා විශේෂයෙන් රූපවාහිනී ප්‍රභේදනවල සහ එම ව්‍යුහයේ අනාගතය නිවැරැදිව පූර්වකථනය කිරීම සඳහාත්, වෙනස් වන්නා වූ ලෝකයෙහි ප්‍රේක්ෂකයින්ගේ අවශ්‍යතා හා වුවමනා තේරුම් ගැනීම සඳහාත් අද්‍යතන ලෝකයෙහි සිදු වන විපරිවර්තනයන් අධ්‍යයනය කළ යුතුය.

මේ අනුව සමකාලීන ශ්‍රී ලාංකේය රූපවාහිනියේ ප්‍රභේදන ව්‍යුහය සම්බන්ධව කතා කිරීමේදී ප්‍රධාන අභියෝග දෙකක් පැහැදිලිව පවතී. ඉන් පළමුවැන්න වන්නේ

රූපවාහිනී ප්‍රභේදනය පිළිබඳ සංකල්පීය අවබෝධ වර්ධනය කර ගැනීමත්, ඒවායේ ඓතිහාසිය හා වංශීවේදීය සීමා හා ප්‍රමිතිවලට අදාළ පරාමිතීන් සකස් කර ගැනීමත්ය. දෙවැන්න වන්නේ වර්මාන ලෝක රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහයේ සිදුවන විපරිවර්තනයන් දැන හඳුනා ගැනීමත්, එම විපරිවර්තනයන් සිදු වන මූලික ප්‍රවණතා අවබෝධකර ගැනීමත්ය. වර්තමාන බහුවිධ රූපවාහිනී ප්‍රභේදන අවකාශය තුළ රූපවාහිනී ප්‍රේක්ෂකයාගේ විඥානය හැඩගස්වනවා පමණක් නොව, එය ප්‍රේක්ෂකයා ලෝකයට දක්වන විඥාපනික, සෞන්දර්යාත්මක, ආකල්පය පමණක් නොව, ඔහුගේ බුද්ධිමය හා ආධ්‍යාත්මික සම්බන්ධතාව පවා හැඩගැස්වීමට තීරණාත්මක බලපෑමක් කරන්නේය. ඒ නිසා රූපවාහිනී ප්‍රභේදනවල ගුණාත්මක භාවය හා ඵලදායිකතාව හා වෘත්තීයභාවය ප්‍රවර්ධනය කිරීම අතිශය වැදගත් අවශ්‍යතාවකි. වර්තමාන ලෝක රූපවාහිනියේ ප්‍රභේදන ව්‍යුහයේ අර්බුදය එම ව්‍යුහයේ අභ්‍යන්තර තර්කනය මගින් පමණක් අති කරන්නක් නොව, එය සමාජ සැකැස්මේ ප්‍රතිවිරෝධතා ගතික මගින්ද උත්කර්ෂණය කරන්නකි. රූපවාහිනිය එහි ප්‍රභේදන ව්‍යහයේ ක්‍රියාකාරිත්වය සමඟ පමණක් පවතින්නක් නොව, එය කර්මාන්තයක්, ව්‍යාපාරයක් සහ බල හා පාලන ක්ෂේත්‍රයක් වශයෙන් පුළුල් අන්තර්ක්‍රියාකාරිත්වයක පවතින්නකි. මේ නිසා රූපවාහිනියේ ප්‍රභේදන ව්‍යුහයේ ගැටලුව අවසාන වශයෙන් සමාජ සැකැස්මේම ගැටලුවකි.


- **Critical Dictionary of Film and Television Theory** (2001), Eds. Roberta E, Pearson and Philip Simpson) London , Routledge.
- Victoria O, Donnell (2007) **Television Criticism,** Sage Publications, London.
- Bondebjerg Ib., 1996 **Public Discourse/Private Fascination, Hybridization in "True- life - story Genres, media, culture and Society.**
- Annette Hill (2007) **Reality TV-Audiences and popular factual Television, Routledge,** London.
- Corner, John (1995) **Television from and Public Address,** London.
- Corner John (1999) **Critical Ideas in Television Studies,** Oxford University Press.
- Gauntlett David and Hill, Annette (1999) **TV Living Television, Culture and Everyday Life** Routledge London.
- Jhattui, gane (2001) The Celebrity Talk Show, in G Creeber (ed). **The Television Genre Book,** London, British Film institute.
- Creeber, Glen (Ed.) (2001) **The Television Genre Book,** Berkeley, CA: University of California Press.
- Watson, J and Hill, A (2003) **Dictionary of Media and Communication Studies** (6th ed) London UK Arnold.
- Mittell, J (2004) **Genre and Television; From cop shops to cartoons in America Culture,** New York; Rouledge.
- Matt Briggs (2010) **Television, Audiences and everyday life,** New Delhi.